# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Services, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

| දුරකතන | ෆැක්ස් | ඊ-මේල් | වෙබ් අඩවිය |
|---|---|---|---|
| தொலைபேசி:**(94) 011- 2694560** | தொலைநகல்:**(94) 011- 2692254** | மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk** | இணையத்தளம்: **www.pubad.gov.lk** |
| Telephone | Fax | E-mail | Web Site |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | PS/GT/2020-(III වෙළුම) | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி:<br>Date | 2021.12.15 |

සියලු ම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරු/පළාත් ප්‍රධාන ලේකම්වරු
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරු
කොමිෂන් සභා ලේකම්වරු
දිස්ත්‍රික් ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**උපාධිධාරී අභ්‍යාසලාභීන් රැකියාගත කිරීමේ වැඩසටහන - 2020**

උක්ත වැඩසටහන යටතේ බඳවාගත් අභ්‍යාසලාභී උපාධිධාරීන්ට ස්ථිර පත්වීම් ලිපි නිකුත් කිරීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

02. ඒ සඳහා සියලු ම තොරතුරු මේ වන විට දිස්ත්‍රික් ලේකම්වරු වෙතින් කැඳවා ඇති අතර පත්වීම් ලිපි මුද්‍රණය සඳහා misco මුද්‍රණාංශය සකස් කරමින් පවතින බැවින් තවදුරටත් අභ්‍යාසලාභී උපාධිධාරීන්ගේ සේවා ස්ථාන සංශෝධන/ස්ථානමාරු/පළාත් අතර මාරුවීම් සඳහා වන පෞද්ගලික ඉල්ලීම් ඉටු කළ නොහැකි බව කාරුණිකව දන්වමි.

03. එබැවින් පත්වීම් ලැබීමට නියමිත අභ්‍යාසලාභීන් විවිධ සේවා ස්ථාන වෙනස් කර ගැනීම සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයට පැමිණ හෝ නොපැමිණ හෝ කරනු ලබන කිසිඳු ඉල්ලීමක් සලකා නොලබන බවට ද, විධිමත් අනුමැතියකින් තොරව මෙම දිනවල අමාත්‍යාංශය වෙත පැමිණ පත්වීම් ලබා දීමේ ක්‍රියාවලියට බාධා කිරීම එම අභ්‍යාසලාභීන් සම්බන්ධයෙන් විනය කටයුතු කිරීමට හේතු වන බවට ද එම නිලධාරීන් දැනුවත් කිරීම මැනවි.

04. එමෙන්ම තවමත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලබා නොමැති <u>අභ්‍යාසලාභීන්ගේ පෞද්ගලික ඉල්ලීම් සැලකිල්ලට ගෙන ආයතනවල සංවර්ධන නිලධාරී සේවයේ පුරප්පාඩු පවතින බවට</u> ලිපි නිකුත් කිරීම සුදුසු නොවන කටයුත්තක් බව ද පෙන්වා දෙනු කැමැත්තෙමි.

05. ඉහත වැඩසටහන සම්බන්ධව රාජකාරිමය ස්වරූපයෙන් ඔබ මා සමග සිදු කරන ලිපි ගනුදෙනු සඳහා මෙම නිවේදනය අදාළ නොවන බව ද සැලකුව මැනවි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය